YEARS IN THE FIGHT AGAINST CORRUPTION

TRANSPARENCY INTERNATIONAL SRI LANKA

a nation that upholds integrity

කෙටි අධ්‍යයන සටහන්

අර්බුද පවතින සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කාලවලදී

# අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

# පසුබිම

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යනු යමකුට රාජ්‍ය මැදිහත්වීමකින් තොරව තම දැක්ම, අදහස්, හැඟීම් සහ සිතුවිලි බෙදාගැනීමට ඇති අයිතියයි.[1] එලදායී ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් සහ මානව හිමිකම්වලට ගරුකිරීමේ සන්දර්භයක් තුළ, ප්‍රකාශනයේ නිදහස වියුක්ත අයිතිවාසිකමක් ලෙස පමණක් නොව, අනෙකුත් මානව හිමිකම් ආරක්ෂා කිරීමේ මෙවලමක් ලෙසද කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටුකරයි. ස්වාධීන සහ අපක්ෂපාතී අධිකරණ මගින් ආරක්ෂා කරන ලද, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ පුළුල් සහතිකයක් නොමැතිව, නිදහස් රටක් හෝ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් පැවතිය නොහැක. මෙම පොදු මූලධර්මය ප්‍රතික්ෂේප කළ නොහැකිය.[2]

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස අයිතිවාසිකමක් වන අතරම, රැස්වීමේ නිදහස වැනි අනෙකුත් ආරක්ෂිත අයිතිවාසිකම්වල අංගයක් ලෙසද හඳුනාගත හැකිය. කෙසේවෙතත්, ප්‍රකාශනයේ නිදහස විසින් ඒ හා සමානව වැදගත් වන අනෙකුත් විශ්වීය වශයෙන් පිළිගත් අයිතිවාසිකම් සහ නිදහසෙහි අර්ථ නිරූපණයන් උල්ලංඝනය නොකළ යුතුය. එය ඇතැම් විට සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය, පෞද්ගලික ජීවිතයට ගරුකිරීම සහ හෘදය සාක්ෂියේ හා ආගමික නිදහස වැනි වෙනත් ආරක්ෂිත අයිතිවාසිකම් සමඟ ගැටීමේ හැකියාවක් පවතී. බලධාරීන්ට ජාතික ආරක්ෂාව හෝ මහජන සෞඛ්‍යය වැනි අවශ්‍යතා හෝ වටිනාකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය වූ විට ගැටුම් ඇතිවිය හැක. එවැනි ගැටුම් ඇති වූ විට, එක් අයිතියක් අනෙකට වඩා ප්‍රමුඛ බව තහවුරු කිරීම මගින් අධිකරණය සමතුලිතතාවක් ඇති කරනු ලබයි. මේ ආකාරයට ළඟාවිය යුතු අතර ගැටුම් තුලනය කිරීමේදී අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසේ වැදගත්කම සැළකිල්ලට ගනු ලබයි.

ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලියකට සහ සෑම මනුෂ්‍යයකුගේම සංවර්ධනයට අත්‍යවශ්‍ය වේ. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැගී ඇත්තේ පොදු කාරණා සම්බන්ධයෙන් එහි පුරවැසියන්ගේ අදහස් හා මතයන්වලට ගරුකරන මූලධර්මය මතය. මෙය සාක්ෂාත් කරගත හැක්කේ නිදහස් විවාදයෙන් සහ ජනතාව අතර සිදුවන අදහස් හුවමාරුව සීමා නොකිරීම මගින් පමණි. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ, මහජන අවශ්‍යතා පිළිබඳ කරුණු සාකච්ඡා කර සාමූහික තීරණ ගැනීමට නම්, ඡන්දදායකයන් සහ ඔවුන්ගේ පාර්ලිමේන්තු නියෝජිතයන් යන දෙකොට්ඨාශයම ඇතුළත් වන, විවෘත සාකච්ඡාවකට අවස්ථාවක් තිබිය යුතුය. රජය ජනතාවට වගවන බව සහ ජනතාවගේ කැමැත්තට ප්‍රතිචාර දක්වන බව සහතික කරනු ලබන්නේ නිදහස් සාකච්ඡා හා විවේචන මගිනි. ප්‍රචණ්ඩත්වයට නොගොස් රජයේ වැරදි සාමකාමීව විසඳාගත හැක්කේ සහ ඊට අවශ්‍ය වෙනස්කම් කළ හැක්කේ එවැනි සංවාදයක් මගිනි. එවැනි නිදහසක් නොමැති වුවහොත්, ජනතාව පීඩාකාරී පාලන තන්ත්‍රයන් පෙරළාදැමීම සඳහා අවසානයේ ප්‍රචණ්ඩකාරී ක්‍රමවලට යොමුවිය හැකිය.[3]

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වැනි වගන්තිය මගින්, " තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත" යනුවෙන් ප්‍රකාශ කරන අතර, බාධාවකින් තොරව, තම මත දැරීමටත්, දේශසීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමටත් අයිතිය ඊට ඇතුළත්ය"(එක්සත් ජාතීන්, 1948) යනුවෙන් සඳහන් කෙරේ.[4]

ඒ හා සමානව, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ ( ICCPR) 19 (2) වගන්තිය ප්‍රකාශ කරන්නේ "සෑම කෙනෙකුටම ප්‍රකාශනයේ නිදහසට අයිතිය ඇත; දේශසීමා නොතකා, වාචිකව, ලිඛිතව හෝ මුද්‍රණයෙන්, කලාවක් ස්වරූපයෙන් හෝ යමකු කැමති වෙනත් මාධ්‍යයක් හරහා සියලු ආකාරයේ තොරතුරු සහ අදහස් සෙවීමට, ලැබීමට සහ බෙදාහැරීමට ඇති නිදහස මෙම අයිතියට ඇතුළත් වේ." (එ.ජා. මහා මණ්ඩලය, 1966) යනුවෙනි.[5]

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් ලෙස හඳුනාගන්නා ශ්‍රී ලංකාව විවිධ දේශීය හා අන්තර්ජාතික නීති හරහා ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයන් ආරක්ෂා කිරීමට බැඳී සිටී. රටේ උත්තරීතර නීතිය ලෙස පිළිගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන වගන්ති කිහිපයකින් මෙම බැඳීම අවධාරණය කර ඇත. එහි 3 වැනි වගන්තියේ මෙසේ සඳහන් වේ." ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේය."[6]

1. 'Freedom of Expression and Right to Information' (LawNet) https://www.lawnet.gov.lk/freedom-of-expression-and-right-to-information/ accessed 9 May 2024.
2. Jochen Abr. Frowein, "Freedom of expression under the European Convention on Human Rights", in Monitor/Inf (97) 3, Council of Europe.
3. 'Freedom of Expression and Right to Information' (LawNet) https://www.lawnet.gov.lk/freedom-of-expression-and-right-to-information/ accessed 9 May 2024.
4. Article 19 of the Universal Declaration of Human Rights
5. Article 19(2) of the International Covenant on Civil and Political Rights (ICCPR)
6. Article 03 of Constitution od Sri Lanka,1978.

එසේම එහි 14 වැනි වගන්තිය මගින් සෑම පුරවැසියෙකුටම (අ) ප්‍රකාශනය ඇතුළුව භාෂණයේ සහ අදහස් ප්‍රකාශනයේ නිදහස; (ආ) සාමකාමීව රැස්වීමේ නිදහස; (ඇ) සමාගමයේ නිදහස; ...ආදී හිමිකම් ඇති බව සහතික කර තිබේ. ".[7]

## වත්මන් තත්ත්වය

2022 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාව අරගලය නමින් හැඳින්වුණු දැවැන්ත ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක් අත්දුටුවේය. දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටි පුරවැසියෝ වීදි බැස එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට ඉල්ලා අස්විය යුතු බවට බලකළහ. මෙය සිදුවූයේ, ඉන්ධන හිඟය, අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය සහ විදුලිය ඇනහිටීම් ආදියෙන් සමන්විත වූ, බ්‍රිතාන්‍යයන්ගෙන් රට නිදහස ලැබීමෙන් පසු රට මුහුණ දුන් දරුණුතම ආර්ථික පසුබෑම හේතුවෙනි. මෙම අරගල ව්‍යාපාරය මතුවූයේ පාලන තන්ත්‍රයේ නීතිවිරෝධී සහ දූෂිත භාවිතයන් පිළිබඳ පුලුල්ව පැතිරුණු අප්‍රසාදය නිසා වෙනි. එය 2022 මුල් භාගයේදී සාමකාමීව ආරම්භ වූ අතර, ෆෙස්බුක්, යූ ටියුබ් සහ ඉන්ස්ටග්‍රෑම් වැනි සමාජ මාධ්‍ය වේදිකා ජනතාවගේ අතෘප්තිය ප්‍රකාශ කිරීමට, පුරවැසියන් ඒකරාශී කිරීමට සහ බලගැන්වීමට තීරණාත්මක කාර්යභාරයක් ඉටුකළේය.

'අරගලය' විරෝධතා ව්‍යාපාරය තුළ මිනිසුන් විවිධ නිර්මාණාත්මක ක්‍රම ඔස්සේ තම භාෂණයේ නිදහස භාවිත කළහ. නාට්‍යකරුවන්ට සහ කලාකරුවන්ට සමාජ ප්‍රශ්න කරළියට ගෙන ඒමේ අවස්ථා ද එම ව්‍යාපාරය විසින් ලබාදෙනු ලැබිණි. ජාතිවාදී ප්‍රචාරණව්‍යාපාර වලින් බෙදුණු ප්‍රජාවන්ගේ එකමුතුකම සංකේතවත් කරමින් විරෝධතාකරුවෝ විවිධ වාර්ගික ඇඳුමින් පැළඳුමින් සැරසී සිටින කාන්තාවන් නිරූපිත බිතුසිතුවම් සහ චිත්‍ර නිර්මාණය කළහ. වීදි නාට්‍ය සහ ප්‍රතිසංස්කරණ පිළිබඳ විවෘත සාකච්ඡා විරෝධතාවල ප්‍රමුඛ ලක්ෂණ බවට පත්විය. රට පුරා සිටින කලාකරුවන්ට 'කලාත්මක නිර්මාණ හරහා රාජපක්ෂ පවුල පිළිබඳ විවේචනයක් සිදුකිරීමට' මෙම විරෝධතාව ඉවහල්වූ බව නවසීලන්තයේ Disinfo ව්‍යාපෘතියේ පර්යේෂකයකු වන ආචාර්ය සංජන හත්තොටුව නිරීක්ෂණය කර තිබිණි.[8]

පාලන තන්ත්‍රය කෙරෙහි මහජන විරෝධය වර්ධනය වීමත් සමඟ රජයේ ප්‍රතිචාරය එන්න එන්නම දරුණු විය. පවතින ආර්ථික අර්බුදය මධ්‍යයේ විරෝධතාකරුවන් මර්දනය කිරීමට සහ නිශ්ශබ්ද කිරීමට ආරක්ෂක අංශ දැඩි උපක්‍රම යොදා ඇඳිරි නීතිය පැනවූ අතර, හදිසි තත්ත්වයක්ද ප්‍රකාශයට පත්කෙරිණි. 2022 මාර්තු 31 වැනි දින, එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ නිවෙස ඉදිරිපිට පැවැති සාමකාමී උද්ඝෝෂණයක් අතරතුර, විරෝධතාකරුවන්ට සහ එම අවස්ථාව ආවරණය කරමින් සිටි ජනමාධ්‍යවේදීන්ට පොලිසිය පහර දුන්නේය. එම 'මිරිහාන ගැටුමේ' ප්‍රතිඵලයක් ලෙස විශේෂ කාර්ය බළකායේ (STF) 24 දෙනකු, පොලිස් නිලධාරීන් තිදෙනකු සහ ජනමාධ්‍යවේදීන් හත්දෙනකු ඇතුළු 37 දෙනෙකු තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර තිබිණි. ජනමාධ්‍යවේදීන් හත්දෙනකුට පහරදීමත් සමඟ සන්නද්ධ හමුදාවන් විසින් හිතාමතාම ජනමාධ්‍යවේදීන් ඉලක්ක කර ඇති බවට වාර්තා පළවිය.[9] 2022 අප්‍රේල් 3 වැනි දින, , රජයට එරෙහි විරෝධතා සංවිධානය කිරීම වැළැක්වීමේ උත්සාහයක් ලෙස, සියලු සමාජ මාධ්‍ය වේදිකා අවහිර කරන ලෙස විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි අන්තර්ජාල සේවා සපයන්නන්ට නියෝග කළේය. ඒ අනුව ෆෙස්බුක්, යූ ටියුබ්, ට්විටර් වැනි සමාජ මාධ්‍ය වේදිකා සහ වට්ස්ඇප් සහ ටෙලිග්‍රෑම් වැනි පණිවිඩ සේවා පැය 16ක් අවහිර කර තිබිණි.[10] 2022 මාර්තු මාසයේදී, ජාතික රූපවාහිනී නාලිකාවේ සේවය කළ රූපවාහිනී නිවේදිකාවක් වන පාරමී නිලේප්තා රණසිංහ, රජය විවේචනය කරමින් ෆෙස්බුක් සටහනක් තැබීම හේතුවෙන් සේවා කටයුතු අත්හිටුවා, නාලිකා පරිශ්‍රයට ඇතුළුවීම තහනම් කරන ලදී.[11] මීට අමතරව, 2022 අප්‍රේල් 1 වැනි දින, ෆේස්බුක්හි "#GoHomeGota" හෑෂ්ටැගය නිර්මාණය කළ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන අනුරුද්ධ බණ්ඩාර අත්අඩංගුවට ගත් සිවිල් ඇඳුමින් සැරසුණු පොලිසිය, 'රාජ්‍යයට එරෙහි විරුද්ධත්වය ඇවිස්සීම හෝ ඇවිස්සීමට තැත්කිරීම' සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්තිය යටතේ ඔහුට චෝදනා එල්ල කළේය.[12]

7. Article 14(1) of Constitution od Sri Lanka,1978.
8. 'Sri Lanka's sorry record on protecting free expression' EconomyNext https://economynext.com/sri-lankas-sorry-record-on-protecting-free-expression-107840/ accessed 10 May 2024.
9. 'March 31 Protests and Aftermath: Updates'https://groundviews.org/2022/04/02/march-31st-protests-updates/ accessed 10 May 2024.
10. 'Sri Lanka restricts access to social media platforms' Ada Derana https://www.adaderana.lk/news.php?nid=81582 accessed 10 May 2024.
11. Sri Lanka: Journalist Parami Nilepthi banned from Rupavahini TV for criticizing the government' IFEX https://ifex.org/sri-lanka-journalist-parami-nilepthi-banned-from-rupavahini-tv-for-criticizing-the-government/ accessed 11 May 2024.
12 . 'Youth activist Anuruddha Bandara released from court case' Ada Derana https://www.adaderana.lk/news.php?nid=83181 accessed 11 May 2024.

ශ්‍රී ලංකාව දැඩි ආර්ථික හා දේශපාලන අර්බුදයකට මුහුණදෙමින් සිටි අතර, මෙම ගැටලු විසඳීමට රජය අසමත් වීම හේතුවෙන් පවතින නීති උපයෝගී කර ගනිමින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ආකාරයෙන් විරෝධතා නිහඬ කිරීමට කටයුතු කෙරිණි. රජයේ මෙම අත්තනෝමතික ක්‍රියාව, මහජනතාවගේ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය සහ ජනමාධ්‍ය ප්‍රජාවගේ වෘත්තීය අයිතිවාසිකම් හිතාමතාම උල්ලංඝනය කිරීමක් විය. විවිධ නීති රෙගුලාසි අත්තනෝමතික ලෙස යොදාගනිමින් අරගලය තුළ ජනතාවගේ භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය යටපත් කිරීමට රජය උත්සාහ කළ බව දැකගත හැකිවිය.

## භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස යටපත් කිරීමට අත්තනෝමතික ලෙස භාවිත කළ නීති සහ රෙගුලාසි

අර්බුදකාරී කාල පරිච්ඡේදය තුළ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය යටපත් කිරීමට අත්තනෝමතික ලෙස භාවිත කරන ලද නීති සහ රෙගුලාසි කිහිපයක් වේ. ඒවා පහත පරිදිය;

1. 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය

2. 1883 අංක 2 දරන දණ්ඩ නීති සංග්‍රහය

3. 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

4. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත

5. 2024 අංක 9 දරන මාර්ගගත ආරක්ෂණ පනත

## 1883 අංක 2 දරන දණ්ඩ නීති සංග්‍රහය

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය 1883 දක්වා දිවෙන අතර, එය ඉංග්‍රීසි අපරාධ නීතියට අනුව සැකැසුණු එම යුගයේ ඉන්දියානු නීතියේ දැඩි ලෙස ආභාෂය ලබා ඇත.

එහි 120 වගන්තියේ සඳහන් වන්නේ, "කථාකරනු ලැබූ හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචනයෙන් හෝ සංඥාවලින් හෝ දැකිය හැකි නිරූපණ වලින් පිහිටුවනු ලැබූ ලංකාණ්ඩුවට විරුද්ධත්වය දැක්වීමේ හැඟීම් අවුස්වතොත් හෝ ඇවිස්වීමට තැත්කරතොත් හෝ නීතිය ක්‍රියාවෙහි යෙදවීමෙහි දී වෛරයක් හෝ අගෞරවයක් ඇති කරවතොත් හෝ ඇතිකරවීමට තැත්කරතොත් හෝ නීත්‍යානුකූල මාර්ගවලින් නොව අන් ලෙසකින් නීතියෙන් පිහිටුවනු ලැබූ යමක් වෙනස් කරවීමට රජතුමාගේ වැසියන් උනන්දු කරවතොත් හෝ රජතුමාගේ වැසියන් අතර අසන්තෝෂය හෝ විරුද්ධත්වය ඇතිකරවීමට හෝ එබඳු වැසියන්ගේ වෙනස් පංති අතර සතුරු වූ ද, අසමගි වූ ද, හැඟීම් වැඩි දියුණු කිරීමට තැත්කරතොත්, ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක ලිහිල් බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළයුතුය" යනුවෙනි.[13]

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 120 වැනි වගන්තිය "දේශද්‍රෝහීත්වය" යන පොදු නීතියේ ඇති වරදට සමානකම් දක්වයි. එහි භාෂාව පුළුල් සහ අපැහැදිලි වේ. දැඩි ලෙස අවශ්‍ය වන්නේ නම් මිස ප්‍රකාශනයේ නිදහස සීමාකිරීම තහනම් කෙරෙන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය ( ICCPR) වැනි ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික බැඳීම් සමඟ එහි ගැළපුම පිළිබඳ ගැටළුවක් ඇති. විචේචකයන් තර්ක කරන්නේ, මෙම විධිවිධානයේ 'දේශද්‍රෝහීත්වය' පිළිබඳ පුළුල් නිර්වචනය බොහෝවිට රජයට සහ බලධාරීන්ට එරෙහිව විරුද්ධ මතයන් මැඩපැවැත්වීමට ලිහිල් ලෙස යොදාගන්නා බවයි.

120 වගන්තිය අනිසි ලෙස භාවිත කිරීමට ඉඩ ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, විසම්මුතිය යටපත් කිරීම සහ රජය වෙත එල්ල කරන සාමකාමී විවේචනවලට බාධා ඇතිවීම සිදුවේ. අරගලය සමයේ #GoHomeGota යන හැෂ් ටැගය නිර්මාණය කළ අනුරුද්ධ බණ්ඩාරට 120 වගන්තිය යටතේ චෝදනා එල්ල විය.

ශ්‍රී ලංකාවේ සහ අන්තර්ජාතික අධිකරණ තීන්දු විසින් දේශද්‍රෝහීත්වය පිළිබඳ අර්ථකථනය තුළ මූලික අංග ලෙස 'මිනිසුන් ප්‍රචණ්ඩත්වයට පොළඹවාලීමේ චේතනාවී හෝ 'මහජන කැළඹීම් ඇති කිරීමී පැවැතීමේ වැදගත්කම අවධාරණය කෙරෙයි. සිසිර කුමාර වාහලතන්ත්‍රී සහ ඩැනිස්ටර් ගුණතිලක එදිරිව ජයන්ත වික්‍රමරත්න සහ තවත් අය යන නඩුවේදී ගුණරත්න විනිසුරුවරයා අවධාරණය කර ඇත්තේ, 'රජයට එරෙහිව අදහස් දැක්වීම් සහ දැඩි වචන සහිත විවේචන මගින් හැඟීම් අවුස්සන්නේ නම් හා ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්

13 . Section 120, Penal Code, No. 2 of 1883

හරහා මහජන කැළඹීමට තුඩු දෙන්නේ නම් මිස, දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්තිය යටතේ පුද්ගලයෙකුට නඩු පැවරීමට හේතු විය නොහැක" යනුවෙනි.[14] 120 වැනි වගන්තියේ හරය වන්නේ, ප්‍රශ්නයට තුඩු දී ඇති වචන වල අපහාසාත්මක ස්වභාවය තක්සේරු කිරීමට වඩා, ප්‍රචණ්ඩකාරී හෝ අක්‍රමික ලෙස හැසිරීමට එම වචන පොළඹවන්නේද යන්න තීරණය කිරීම බව ඔහු එහිදී තවදුරටත් පැහැදිලි කළේය.

ඩෙනින් සාමිවරයා සඳහන් කර ඇත්තේ, "දේශද්‍රෝහීත්වය පිළිබඳ වරද දැන් යල්පැන ඇති නමුත් එහි නිර්වචනය වඩා පුළුල් ලෙස පවතී. එය මහජන කටයුතු පිළිබඳ පූර්ණ සහ නිදහස් සාකච්ඡාව ඕනෑවට වඩා සීමාකරනු ඇත." යනුවෙනි.

කෙසේවෙතත්, මෙම චෝදනාවට එරෙහි වඩාත්ම බලගතු තර්කය 120 වගන්තිය තුළම පවතී. රටකට හෝ රජයක නායකයාට එල්ල කරන විවේචන සඳහා 120 වගන්තිය යටතේ දඬුවම් ලැබිය නොහැකි බව එහි පැහැදිලිව සඳහන් වේ.

## ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (PTA)

අර්බුදය කාලසීමාව තුළ භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යටපත් කිරීමට භාවිත කළ තවත් නීතියක් වන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතයි. 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (PTA) පනවන ලද්දේ හිටපු ජනාධිපති ජේ. ආර්.ජයවර්ධනගේ පාලන සමයේදීය. මහජන අදහස් හෝ විරුද්ධත්වය සඳහා ඇති අවස්ථා සීමාකරමින් මෙම නීතිය 'හදිසි පනතක්' ලෙස පාර්ලිමේන්තුව හරහා කඩිනමින් සම්මත විය. වසර තුනක කාලයක් සඳහා ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමේ තාවකාලික පියවරක් ලෙස මුලින් අදහස් කළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, අවසානයේ රටේ ස්ථිර නීතියක් බවට පත්කරන ලදී.[15]

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳ එක් ප්‍රධාන විවේචනයක් වන්නේ වැරදි පිළිබඳ එහි පුළුල් සහ නොපැහැදිලි නිර්වචනයයි. විසම්මුතිය මැඩපැවැත්වීම සඳහා දේශපාලන මෙවලමක් ලෙස එය භාවිත කිරීම පිළිබඳ අප්‍රසාදය විවධ පාර්ශව විසින් මතුකර ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නීතිමය පැහැදිලිකමක් නොමැතිකම හේතුවෙන් එය අයුතු ලෙස භාවිත කිරීම  වැළැක්වීම සඳහා නිශ්චිත නීති සම්පාදනයක අවශ්‍යතාව ඉස්මතු කරයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2(1)(h) වගන්තියේ මෙසේ සඳහන් වේ; "කියනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මගින් හෝ සංඥා මගින් හෝ දෘශ්‍ය නියෝජන මගින් හෝ අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියා හෝ විවිධ ජනකොටස් නැතහොත් වර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික, වර්ගීය නැතහොත් ජාතිවාදී අසංගතිය නැතහොත් දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇතිවීමට සලස්වන්නා වූ හෝ ඇතිවීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකරුවෙකු විය යුතුය."

තවද, නිසි බලධාරියෙකුගේ අනුමැතියකින් තොරව ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීම් හෝ ආගමික, වාර්ගික හෝ ප්‍රජාවන් අතර අසමගිය ඇති කිරීමට ඉඩ ඇති ඕනෑම අන්තර්ගතයක් මුද්‍රණය කිරීම හෝ පුවත්පත්වල පළකිරීම මෙහි  14 වැනි වගන්තිය මගින් තහනම් කර වරදක් බවට පත් කර තිබේ.

නීතිය බලාත්මක කරන නිලධාරීන්ට ඇතුළුවීම, සෙවීම්, භාරයට ගැනීම සහ අත්අඩංගුවට ගැනීම සඳහා මෙම පනත මගින් පුළුල් බලතල ලබා දී ඇත. මෙම මර්දනකාරී නීතිය ශ්‍රී ලංකාවේ ප්‍රකාශනයේ නිදහසට සෘණාත්මක ලෙස බලපා ඇති අතර, බොහෝ විට ආණ්ඩු විසින් සිය විරුද්ධවාදීන් මර්දනය කිරීමට මෙය භාවිත කරයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ඵලදායී ලෙස ත්‍රස්තවාදය මැඩපවත්වා නොමැති නමුත්, ඒ වෙනුවට මර්දනය සඳහා මෙවලමක් ලෙස යොදා ගන්නා බව නිදහස් අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳ ගෝලීය වශයෙන් පිළිගත් විශේෂඥයකු වන ආචාර්ය ගෙහාන් ගුණතිලක ප්‍රකාශ කරයි. පනත යටතේ රඳවාගෙන සිටින පුද්ගලයන් බොහෝවිට සැළකිය යුතු ත්‍රස්තවාදී නායකයන් හෝ ක්‍රියාකාරී කුමන්ත්‍රණවලට සම්බන්ධ අය නොවන බවත්, ඒ වෙනුවට සටන්කාමී කණ්ඩායම් සමඟ යාන්තමින් ගනුදෙනු කළ හෝ ඇතැම් හඳුනා

14 . SC FR /768/2009

15 . REGULATING SOCIAL MEDIA IN SRI LANKA An Analysis of the Legal and Non-Legal Regulatory Frameworks in the Context of Hate Speech and Disinformation

ගන්නා ලද කණ්ඩායම්වලට අයත් පුද්ගලයන් බවත් ඔහු අවධාරණය කරයි.[16] 2022 අරගලය ව්‍යාපාරයේ දී මෙය පැහැදිලි විය. අරගලය යුගයේදී එලෙස හඳුනාගත් කණ්ඩායම තරුණ ක්‍රියාකාරීන් විය.

2022 අරගල සමයේ උද්ඝෝෂණ වලදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ක්‍රියාකාරීන් කිහිපදෙනකු රඳවා තබා ගන්නා ලදී. විශේෂයෙන්ම එවකට අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ, අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු පූජ්‍ය ගල්වැව සිරිධම්ම හිමි සහ කැලණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සාමාජික හශාන්ත ජවන්ත ගුණතිලක 2022 අගෝස්තු 18 සහ 19 යන දෙදින තුළ අත්අඩංගුවට ගනු ලැබීය. ඊට ප්‍රතිචාර වශයෙන් ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයෙහි (Amnesty International) දකුණු ආසියා අධ්‍යක්ෂ යාමිනී මිශ්රා, එම රඳවා තබාගැනීම හෙළාදකිමින් නිවේදනයක් නිකුත් කළාය. "විරෝධතාකරුවන් මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව කුරිරු ත්‍රස්ත විරෝධී නීතියක් භාවිත කිරීම කණගාටුදායක තත්ත්වයකි. දැනටමත් දැඩි ලෙස විවේචනයට ලක්ව ඇති මෙම නීතිය ක්‍රියාත්මක කිරීම වහාම අවලංගු කළ යුතුය. කිසිම ආකාරයක විසම්මුතියක් ඉවසා සිටීමට බලධාරීන්ගේ ඇති අකමැත්ත සහ විරුද්ධ හඬවල් ක්‍රමානුකූලව මර්දනය කිරීමට කටයුතු කිරීම මෙහිදී දැඩි අවධානයට ලක්කරනු ලැබේ.

විරෝධතාකරුවන්ට එරෙහිව එල්ල කර ඇති ත්‍රස්තවාදී චෝදනා ඔවුන් කළ බවට චෝදනා කරන කිසිදු ක්‍රියාවක් සමඟ නොගැලපේ. බලධාරීන්ගේ අවශ්‍ය ප්‍රමාණයට වඩා එහා ගිය ප්‍රතිචාරය, අසමාන සහ අන්තර්ජාතික නීතියට පටහැනි බව කිව යුතුය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් සැකකරුවන් වසරක් දක්වා කාලයක් චෝදනාවකින් තොරව රඳවා තබාගැනීමට ඉඩ සලසා දී ඇති අතර එය අන්තර්ජාතික සම්මතයන් පැහැදිලිවම උල්ලංඝනය කිරීමකි. ආරක්ෂක ඇමැතිවරයා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඔවුන්ගේ රඳවා තබාගැනීම දීර්ඝ කිරීමෙන් වැළකිය යුතුය.[17]

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ බොහෝ ගැඹුරු දෝෂ සහිත විධිවිධාන අතර, මෙම නීතිය යටතේ රඳවාගෙන සිටින පුද්ගලයන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වීමට පෙන්වාදීමේදී පහත සඳහන් දෑ විශේෂයෙන් හේතු වේ.

- රැඳවියන් චෝදනාවකින් තොරව මාස 18 ක් දක්වා රඳවා තබාගත හැකිය.
- අධිකරණයේ අභියාචනා කිරීමේ හැකියාවකින් තොරව, අදහස් ප්‍රකාශ කිරීමේ සහ ඇසුරේ නිදහස සීමාකරන අත්තනෝමතික නියෝග ආරක්ෂක ඇමැතිවරයාට නිකුත්කළ හැකිය.
- පාපොච්චාරණයන් උසාවියේදී පිළිගත හැකි වන විශේෂ සාක්ෂි නීති ඇතුළත් වේ.
- බලහත්කාරයෙන් ප්‍රකාශයක් කළ බව උසාවියකට ඔප්පු කිරීමේ භාරය සැකකරුවන්ට සතුවේ.
- ඇප ලබාදීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ විධිවිධාන අපැහැදිලි වන අතර, මෙම පැහැදිලි නොමැතිකම හේතුවෙන් ඇතැම් රැඳවියන්ට ඇප ලබාදීම ප්‍රතික්ෂේප වේ.

ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (PTA) විසින් අර්බුදකාරී කාල පරිච්ඡේද තුළ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය යටපත් කර ඇති අතර එය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට තුඩු දී ඇති බව පැහැදිලිය.

කෙසේවෙතත්, ශ්‍රී ලංකා රජය 2023 සැප්තැම්බර් 15 වැනි දින සංශෝධිත 'ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත' ගැසට් පත්‍රයේ පළ කරන ලදී. මර්දනය කිරීමේ දරුණුතම මෙවලමක් ලෙස ක්‍රියා කර ඇති, දශක හතරහමාරකට ආසන්න කාලයක් රාජ්‍ය තාඩන පීඩන ක්‍රියාත්මක කළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ඉවත් කිරීම මෙම පනත් කෙටුම්පත මගින් අරමුණු කර ඇත.

කෙසේවෙතත්, යෝජිත නීතිය ද මර්දනකාරී බව පෙනේ. එය පුළුල්ව ඉදිරිපත් කෙරුණු විවේචන හේතුවෙන් ඉවත් කර ගන්නා ලද පෙර කෙටුම්පත්වලට සැළකිව යුතු ලෙස සමාන වේ. නව පනත් කෙටුම්පත විසින් 'ත්‍රස්තවාදී' ක්‍රියාවන් ඕනෑවට වඩා පුළුල් ලෙස නිර්වචනය කරන බව පෙනේ. විශේෂයෙන් රැඳවුම් නියෝගවල නීත්‍යානුකූලභාවයට අභියෝග කිරීමේදී අධිකරණ ඇපකර සීමා කරයි. රැඳවුම් ස්ථානවලට යෑමට මානව හිමිකම් කොමිසමට ඇති හැකියාව සීමා කිරීම මෙහි ඇති අනෙකුත් ගැටළු සහගත විධිවිධාන අතර වේ. නව පනත් කෙටුම්පත මගින් ත්‍රස්තවාදයේ නිර්වචනය දේපල හානි, සොරකම් හෝ මංකොල්ලකෑම් වැනි අපරාධ දක්වා පුළුල් කිරීමට යෝජනා කරන අතරම, රැස්වීමේ සහ කතාකිරීමේ නිදහසට ඇති අයිතිය සීමාකරනු

16. 'Sri Lanka's sorry record on protecting free expression' EconomyNext https://economynext.com/sri-lankas-sorry-record-on-protecting-free-expression-107840/ accessed 12 May 2024.
17. 'Sri Lanka: Protesters must not be detained under the draconian anti-terror law' Amnesty International https://www.amnesty.org/en/latest/news/2022/08/sri-lanka-protesters-must-not-be-detained-under-the-draconian-anti-terror-law/ accessed 12 May 2024.

ලබයි. එසේම වරෙන්තුවක් නොමැතිව ඕනෑම අයකු අත්අඩංගුවට ගැනීමට හෝ ඕනෑම දෙයක් අත්පත් කර ගැනීමට බලධාරීන්ට බලතල ලබා දේ.[18]

මෙම පනත් කෙටුම්පත එහි වර්තමාන ස්වරූපයෙන් සම්මත වුවහොත්, අයිතිවාසිකම් සීමාකිරීමට විධායකයට අධික බලතල ලබාදෙනු ඇත. එහි විධිවිධාන අයුතු ලෙස භාවිතය පිළිබඳව ඇත්තේ සීමිත ආරක්ෂාවක් පමණි, සමහර විට එයද නොතිබිය හැක. එය වරෙන්තු නොමැතිව පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට ආරක්ෂක අංශවලට ඇති නීතිමය හැකියාව පුළුල් කරන අතර තවදුරටත් නඩු විභාගයකට පෙර දීර්ඝ රඳවා තබාගැනීමට අවසර දෙනු ඇත.

ශ්‍රී ලංකාවේ අලුතින් යෝජිත ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත, දැනට ක්‍රියාත්මක කුරිරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (PTA) දෝෂ ආමන්ත්‍රණය කිරීමට ප්‍රමාණවත් නොවන බව පෙනේ.

"ශ්‍රී ලංකාවේ වත්මන් ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිය, එහි නොපැහැදිලි අර්ථනිරූපණය, මූලික මානව හිමිකම් ආරක්ෂා නොකිරීම සහ ස්වාධීන අධීක්ෂණයක් නොමැතිකම හේතුවෙන් අන්තර්ජාතික නීතිය උල්ලංඝනය කරන බව එක්සත් ජාතීන්ගේ විශේෂඥයන් සහ බහුපාර්ශ්වික සංවිධාන දිගු කලක් තිස්සේ ප්‍රකාශ කර ඇත," යැයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශේෂඥයෝ පවසති. "යෝජිත නීති සම්පාදනය මගින්ද මෙම කිසිදු ගැටළුවක් නිවැරදි කිරීමට අපොහොසත් වීම ගැන ඇත්තේ දැඩි කණගාටුවකි," යැයි ඔවුහු වැඩිදුරටත් සඳහන් කරති.

## 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR) පනත

ICCPR පනත ශ්‍රී ලංකාවේ ප්‍රකාශනයේ නිදහස සීමාකරන තවත් නීතියක් ලෙස සැළකිව හැකිය. ICCPR පනත ශ්‍රී ලංකාවේ ද්වේෂසහගත ප්‍රකාශවලට එරෙහිවීම අරමුණු කරගත් ප්‍රධාන නීති සම්පාදනයක් ලෙස පවතී. 2015 සිට, ICCPR පනත වැරදි ලෙස භාවිත කිරීමේ අවිචාරවත් ප්‍රවණතාවක් පවතී.

පනතේ 3 (1) වගන්තිය මගින් පැහැදිලිවම යුද්ධය ප්‍රචාරය කිරීම හෝ වෙනස්කොට සැළකීම, සතුරුකමට හෝ ප්‍රචණ්ඩත්වයට තුඩුදිය හැකි ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනීසිටීම තහනම් කර ඇත. 3(2) වගන්තිය විසින් (1) උපවගන්තියේ විස්තර කර ඇති වැරදිවලට සම්බන්ධ පුද්ගලයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙනහැර දක්වයි. එවැනි වැරදි කිරීමට උත්සාහ කිරීම, එවැනි ක්‍රියාවන්ට ආධාර කිරීම හෝ අනුබල දීම හෝ එසේ කිරීමට තර්ජන කිරීම පවා මෙයට ඇතුළත් ය. (1) හෝ (2) යන උපවගන්තිය යටතේ වරදකරුවන් වන අයට වසර දහයක් දක්වා බරපතළ වැඩ සහිතව සිරගත කිරීම ඇතුළු දඬුවම් නියම කිරීමට මහාධිකරණයට හැකිය.

අරගල කාලයෙන් පසු රජය සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් ඉලක්ක කර ගනිමින් විවිධ මර්දනකාරී ක්‍රියා සිදුකළේය. ශ්‍රී ලාංකික නැගී එන ප්‍රහසන රංගන ශිල්පිනියක වන නතාෂා එදිරිසූරිය 2023 මැයි 27 වැනි දින කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) පරිගණක අපරාධ විමර්ශන අංශය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. 2023 අප්‍රේල් මාසයේ 'මෝඩභිමානය' වැඩසටහනේදී ඇය ඉදිරිපත් කළ ප්‍රහසනය, පසුව මැයි 24 වන දින යූ ටියුබ් හි පළ කරන ලද අතර, එහිදී ඇය බුද්ධාගමට අපහාසාත්මක ප්‍රකාශ කළ බවට එල්ල වූ චෝදනා මත මෙම ක්‍රියාමාර්ගය ගනු ලැබිණි.

ඇය 2023 මැයි 28 වැනි දින කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පෙනීසිටි අතර, 2007 අංක 56 දරන ICCPR පනතේ 3(1) වගන්තියේ මෙන්ම දණ්ඩ නීති සංග්‍රහයේ 291A සහ 291B වගන්තිවල ප්‍රතිපාදන යටතේ ද ඇයට චෝදනා එල්ල කෙරිණි. මෙම කොටස් පිළිවෙළින් පුද්ගලයන්ගේ ආගමික හැඟීම් චේතනාන්විතව රිදවීම සහ පිරිසකගේ ආගමික හැඟීම් හිතාමතාම රිදවීම සම්බන්ධයෙනි.

අධිකරණයේ පෙනීසිටි මුල් අවස්ථාවේදී මහේස්ත්‍රාත්වරයා ඇයව ඇප නොමැතිව රඳවා තැබීමට තීරණය කළේය. කෙසේවෙතත්, පසුව 2023 ජූලි 5 වැනි දින කොළඹ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳි විසින් ඇයට කොන්දේසි සහිත ඇප ලබාදෙන ලදී. ICCPR පනත යටතේ සිදුකරන ලද අත්අඩංගුවට ගැනීම් පිළිබඳ පුළුල් සන්දර්භය තුළ මෙම කොන්දේසි සහිත ඇප ලබාදීමේ තීරණයවැදගත් වේ.[19]

18 . 'UN experts say Sri Lanka's counter-terrorism bill fails to heed their recommendations, status quo fundamentally unchanged' OHCHR (10 October 2023) https://www.ohchr.org/en/press-releases/2023/10/un-experts-say-sri-lankas-counter-terrorism-bill-fails-heed-their accessed 12 May 2024.

19. HCEBA/1335/2023

මෙම නඩුවේදී මහාධිකරණ විනිසුරුවරයා පනතේ අරමුණ, අදාළ අන්තර්ජාතික නීතිය සහ මානව හිමිකම් කොමිසමේ නිර්දේශ සැළකිල්ලට ගනිමින් ආදර්ශමත් ඇප නියෝගයක් නිකුත් කළේය. මෙම තීරණය පනතේ අවභාවිතය අවම කිරීමට සහ නීතියේ වර්ධනයට දායක විය. කෙසේවෙතත් මෙය මහාධිකරණයේ ඇප නියෝගයක් පමණක් බව හඳුනාගැනීම වැදගත්ය. භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යටපත් කිරීම සඳහා අවභාවිත කිරීමේ විභවය තවමත් පනත සතුව පවතී.

කෙසේවෙතත්, 2023 නොවැම්බර් මස රම්සි රාසික්ගේ නඩුවේදී ලබා දුන් මූලික අයිතිවාසිකම් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව හරහා මෙම නීතිය තවදුරටත් වර්ධනය වී ඇත.

රම්සි රාසික් 2022 අප්‍රේල් 9 වැනි දින, ICCPR පනත යටතේ පොලිසිය විසින් රඳවා ගනු ලැබුවේ ඔහුගේ ක්‍රියාකාරීත්වයන් සහ සමාජ මාධ්‍යවල හැසිරීම හරහා අන්තවාදයට හා ජාතිවාදයට අනුකූල අදහස් ප්‍රකාශ කර ඇති බව ප්‍රකාශ කරමිනි. මෙම සිදුවීමේදී, රාසික් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකළේ, ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදුවූ බව පවසමිනි. රාජ්‍ය පාර්ශ්වයෙන් තර්ක කරනු ලැබුවේ, රාසීක්ගේ ෆේස්බුක් සටහනක් මගින් වාර්ගික හා ආගමික එදිරිවාදිකම් අවුස්සමින්, අසමගිය සහ ප්‍රචණ්ඩත්වයේ අවදානමක් මතුකර ඇති අතර, ඔහු අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබාගැනීම සාධාරණ බව පවසමිනි. ඊට ප්‍රතිචාර වශයෙන් විත්ති පාර්ශ්වය පෙන්වා දුන්නේ, මෙම සටහන්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) වගන්තියෙන් සහතික කර ඇති පරිදි ප්‍රකාශනය ඇතුළුව භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සඳහා වූ රාසික්ගේ මූලික අයිතිය ක්‍රියාත්මක කිරීමක් බවයි.

පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් සැබවින්ම උල්ලංඝනය වී ඇති බව නිගමනය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය රජයේ අභිචෝදකයන්ගේ තර්ක ප්‍රතික්ෂේප කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස රම්සි රාසික්ට ඔහුගේ නීති වියදම් පියවා ගැනීමට රුපියල් මිලියනයක් සහ හැටදහසක වන්දියක් (රු. 1,060,000) ගෙවන ලෙස අධිකරණය නියෝග කළේය. රම්සි රාසික්ගේ නඩුවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව, ප්‍රකාශනයේ නිදහසේ වැදගත්කම අවධාරණය කරන සැළකිව යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

## 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (SLTA)

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ඔස්සේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) පිහිටුවන ලද අතර, එමගින් විදුලි සංදේශ පිළිබඳ ඇමැතිවරයාගේ අධිකාරිය නිර්වචනය කරයි. එසේම පනත මගින් යම් යම් උල්ලංඝනයන් සහ ඒවාට දඬුවම් නියම කරන අතර, විදුලි සංදේශ භාවිතය අධීක්ෂණය කිරීමේ රජයේ බලය පුළුල් ලෙස ප්‍රකාශ කරයි. විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් නියම කරන ලද පරිදි නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට මෙම පනත මගින් TRCSL වෙත බලය ලබාදේ.[20] පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ එහි කාර්යභාරයට අනුව විවිධ හේතූන් මත විකාශන අන්තර්ගතයන් නියාමනය කිරීමට හෝ අවහිර කිරීමට TRCSL සමහර අවස්ථා වල මැදිහත් වී ඇත.[21]

අරගලය කාලය තුළ, 2022 අප්‍රේල් 3 වැනි දින, ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අන්තර්ජාල සේවා සපයන්නන් Facebook, WhatsApp, Instagram, Twitter සහ YouTube වැනි සමාජ මාධ්‍ය වේදිකා අවහිර කර ඇති බව ඔසෘඝික නිවේදනය කළේය. TRCSL සමාජ මාධ්‍ය නියාමනය කිරීමේ වගකීම දරන අතර, එය දේශපාලනීකරණය වීම සහ ඊට ලැබී ඇති පුළුල් බලය හේතුවෙන් සමාජ මාධ්‍ය වේදිකාවල අවශ්‍ය ප්‍රමාණයට එහා ගිය නියාමනයක් සිදුවේ.

ශ්‍රී ලංකාවේ TRCSL සම්බන්ධයෙන් සැළකිව යුතු වැදගත් කරුණක් වන්නේ එය දේශපාලනීකරණ වීමයි. නිදසුනක් වශයෙන්, 2022 මැයි මාසයේදී, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, විදුලි සංදේශ නියාමන කොමිසම සහ රජය සතු විදුලි සංදේශ සේවා සැපයන ආයතනය ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත්කිරීමෙන් එහි පාලනය තවදුරටත් මධ්‍යගත කළේය. මෙම පියවර මෙම ක්‍රියාවලියේ ස්වාධීනත්වය පිළිබඳ ගැටලු මතු කළේය.[22]

20. Section 5(f), Sri Lanka Telecommunications Act (SLTA), No. 25 of 1991 (SLTA).
21 . 'Defence Ministry requests to block social media: TRC' Daily Mirror https://www.dailymirror.lk/breaking_news/Defence-Ministry-request-to-block-social-media-TRC/108-234369 accessed 12 May 2024
22 . Freedom House https://freedomhouse.org/country/sri-lanka/freedom-net/2022 accessed 12 May 2024

**2024 අංක 9 දරන මාර්ගගත ආරක්ෂණ පනත**

අරගල ව්‍යාපාරයෙන් පසුව ආණ්ඩුවේ අරමුණ වූයේ සමාජ මාධ්‍ය වේදිකාවල හඬ මර්දනය කිරීමයි. 2024 ජනවාරි 24 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මාර්ගගත ආරක්ෂණ කොමිෂන් සභාවකට පුළුල් බලතල ලබාදෙන මාර්ගගත ආරක්ෂණ පනත සම්මත කරන ලදී. 'තහනම් ප්‍රකාශ' යනු කුමක්ද යන්න තීරණය කිරීමට සහ අන්තර්ජාල සේවා සපයන්නන් හරහා එවැනි අන්තර්ගතයන් ඉවත් කර, ඊට අදාළව වරදකරුවන් ලෙස සැළකෙන අයට ප්‍රවේශය අහිමි කිරීම සඳහා නිර්දේශ කිරීමට මෙම කොමිසමට බලය ඇත. මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජනයක් වන, විවිධ තරාතිරම්වල පුද්ගලයන් අතර අමනාපය සහ සතුරුකම ප්‍රවර්ධනය කරන හෝ නීත්‍යානුකූල ආගමික කටයුතු කඩාකප්පල් කරන ව්‍යාජ ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මෙම පනත මගින් තහනම් කරයි.

පනත් කෙටුම්පතට සමාජ ක්‍රියාකාරීන්ගේ, සිවිල් සමාජ සාමාජිකයන්ගේ සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ( OHCHR ) විවේචන එල්ල විය.

ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයෙහි (Amnesty International) දකුණු ආසියා කලාපීය පර්යේෂක ත්‍යාගි රුවන්පතිරණ මාර්ගගත ආරක්ෂණ පනතට ප්‍රතිචාර දක්වමින් මෙසේ පවසා ඇත. "මාර්ගගත ආරක්ෂණ පනත සම්මත කිරීම ශ්‍රී ලංකාවේ මානව හිමිකම්වලට සැළකිව යුතු පහරකි. මෙම පනත මගින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හැල්ලුවට ලක්කිරීම සහ විරෝධතා යටපත් කිරීම සඳහා පවතින රජයේ මෙවලම් ශක්තිමත් කරයි. බලධාරීන් එය වහා ඉවත්කර රටේ මානව හිමිකම්වලට ගරුකිරීම සහතික කළ යුතුයි."[23]

පනතේ බොහෝ කොටස් අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන් සපුරාලන්නේ නැත. ඒවා අතර, අන්තර්ජාලය හරහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතීන් සීමාකරන ඕනෑවට වඩා පුළුල් විධිවිධාන වේ. බලගතු 'මාර්ගගත ආරක්ෂණ කොමිසමක්' විසින් තීරණය කරනු ලබන 'තහනම් ප්‍රකාශ' වැනි නොපැහැදිලි වචන සහිත වැරදි ද එහි ඇතුළත් වේ. ශ්‍රී ලංකා රාජ්‍යයද පාර්ශ්වයක් වන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR) මගින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ පෞද්ගලිකත්වය සඳහා වන අයිතිවාසිකම් සහතික කෙරේ. එහෙත් ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය සහ ආණ්ඩුවේ විවිධ කප්පාදු කිරීම් හමුවේ දුෂ්කරතාවලට මුහුණදෙන ජනතාව, තම ගැටලු ප්‍රකාශ කරන විට, ප්‍රජා අවකාශය තවදුරටත් සීමාකිරීමට සහ විවේචකයන්ට හා විපක්ෂයට එරෙහිව මර්දනය ක්‍රියාත්මක කිරීමට බලධාරීන් විසින් මෙම නීති සම්පාදනය අනිසි ලෙස භාවිත කිරීමට ඉඩ ඇත.

## නිර්දේශ

ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත, මාර්ගගත ආරක්ෂණ පනත සහ අර්බුදකාරී කාලවලදී ක්‍රියාත්මක අනෙකුත් නියාමනයන්හි පවතින ගැටලු මත පදනම්ව, ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීම සඳහා පහත නිර්දේශ සහ පියවර යෝජනා කරනු ලැබේ.

**1. ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ:**

- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතුය: ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වහා ඉවත්කළ යුතු අතර, එහි භාවිතය තහනම් කළ යුතුය. මෙම ක්‍රියාව මගින් පනත හා සම්බන්ධ දීර්ඝ කාලීන මානව හිමිකම් කඩකිරීම්වලට විසඳුම් ලැබෙනු ඇත.
- මාර්ගගත ආරක්ෂණ පනත සංශෝධනය කළ යුතුය: විශේෂයෙන් 'තහනම් ප්‍රකාශ' සහ වෙනත් නොපැහැදිලි වගන්ති ඇතුළු නිර්වචන පටු කිරීම සඳහා මාර්ගගත ආරක්ෂණ පනතට සැළකිව යුතු සංශෝධන අවශ්‍ය වේ. මෙම වෙනස්කම් ඔස්සේ පනත අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල බවට සහතික කළ යුතුය.
- ICCPR පනත සමාලෝචනය කළ යුතුය: ICCPR පනත අනවශ්‍ය ලෙස ප්‍රකාශනයේ නිදහස සීමා නොකරන බව සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව භාවිත කරන බව සහතික කිරීම සඳහා මෙම පනත පිළිබඳ පුළුල් සමාලෝචනයක් පැවැත්විය යුතුය.

23. 'Sri Lanka: Online Safety Act major blow to freedom of expression' Amnesty International.https://www.amnesty.org/en/latest/news/2024/01/sri-lanka-online-safety-act-major-blow-to-freedom-of-expression/ accessed 12 May 2024

## 2. අධිකරණ සහ ආයතනික ආරක්ෂාව:

- අධිකරණ අධීක්ෂණය වැඩිදියුණු කිරීම: ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, මාර්ගගත ආරක්ෂණ පනත සහ ඒ හා සමාන නීති යටතේ පනවා ඇති රඳවා තබාගැනීම් සහ සීමාකිරීම් පිළිබඳ අධිකරණ අධීක්ෂණය සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. නියාමන ආයතන විසින් ගනු ලබන තීරණ සමාලෝචනය කිරීමට සහ අවලංගු කිරීමට උසාවියට පැහැදිලි බලයක් තිබිය යුතුය.
- නියාමන ආයතන දේශපාලනීකරණය නොකළ යුතුය: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) සහ යෝජිත මාර්ගගත ආරක්ෂණ කොමිසමේ විනිවිදභාවයෙන් යුත් පත්වීම් ක්‍රියාවලියක් හරහා සහ දේශපාලන ඇඟිලි ගැසීම්වලින් ආරක්ෂා කිරීම හරහා ස්වාධීනත්වය සහතික කිරීම.

## 3. ශක්තිමත් ලෙස මානව හිමිකම් ආරක්ෂා කිරීම:

- නියමිත ක්‍රියාවලිය සහතික කිරීම: මෙම නීති යටතේ සියලුම රැඳවියන්ට සාධාරණ නඩු විභාග, නීතිමය නියෝජනය සහ අභියාචනා කිරීමේ අයිතිය ඇතුළුව නියමිත ක්‍රියාවලි ඔස්සේ ලැබෙන අයිතිවාසිකම් ඇති බවට සහතික කළ යුතුය.
- මානව හිමිකම් කොමිෂන් සභාව සවිබල ගැන්වීම: ප්‍රකාශනයේ නිදහසට සම්බන්ධ මානව හිමිකම් කඩවීම් ඇතුළුව මානව හිමිකම් කඩවීම් ඵලදායි ලෙස නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ (HRCSL) බලය සහ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම.

## 4. විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම:

- මහජන සහභාගීත්වය: අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට අදාළ ඕනෑම ව්‍යවස්ථාදායක වෙනස්කමක් සම්බන්ධයෙන් මහජන අදහස් විමසීම සඳහා ක්‍රියාවලියක් ඇති කිරීම. සිවිල් සමාජය, සමාජ ක්‍රියාකාරීන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට සම්බන්ධ කරගැනීම මෙයට ඇතුළත් වේ.
- ක්‍රියාවන්හි විනිවිදභාවය: අන්තර්ගතයන් ඉවත් කිරීම සහ පුද්ගලයින් රඳවා තබාගැනීම ඇතුළු, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ මාර්ගගත ආරක්ෂණ පනත යටතේ ගනු ලබන සියලුම ක්‍රියාමාර්ග, ලේඛනගත කර ඇති බවත්, ස්වාධීන සමාලෝචනයට සහ මහජන හෙළිදරව් කිරීම්වලට යටත් බවත් සහතික කළ යුතුය.

## 5. අධ්‍යාපනය සහ දැනුවත් කිරීම:

- මානව හිමිකම් අධ්‍යාපනය: ප්‍රකාශනයේ නිදහසේ වැදගත්කම අවධාරණය කරමින් මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම. මේ සඳහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා පුහුණුව සහ මානව හිමිකම් අධ්‍යාපනය පාසල් විෂයමාලාවලට ඇතුළත් කිරීම ආදිය කළ හැකිය.
- සිවිල් සමාජයට සහාය ලබාදීම: අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස වෙනුවෙන් පෙනීසිටින සිවිල් සමාජ සංවිධානවලට සහයෝගය ලබාදීම. මෙම සහයෝගයට, අරමුදල්, ධාරිතා ගොඩනැගීමේ සහය සහ තර්ජනවලට මුහුණදෙන ක්‍රියාකාරීන් සඳහා ආරක්ෂක පියවර ඇතුළත් වේ.

## 6. අන්තර්ජාතික මැදිහත්වීම:

- අන්තර්ජාතික උපදේශනය: අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුගතවීමට රජයට සහාය ලබාග ැනීමට සහ බලපෑම් කිරීමට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC) සහ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) වැනි අන්තර්ජාතික මානව හිමිකම් පාර්ශව සමඟ සම්බන්ධ විය යුතුය.
- නිත්‍ය වාර්තාකරණය: ශ්‍රී ලංකාවේ ප්‍රකාශනයේ නිදහසේ තත්ත්වය පිළිබඳව අන්තර්ජාතික ආයතන වෙත නිතිපතා වාර්තා කිරීමට බැඳීම සහ පවතින ගැටලු විසඳීමේදී ඔවුන්ගේ මගපෙන්වීම සහ සහාය ලබාග ැනීම.

## මීළඟ පියවරයන්

1. ක්ෂණික නීතිමය අභියෝග: රජය විසින් පනවන ලද නීතිවල ව්‍යවස්ථාපිතභාවයට අභියෝග කිරීමට පුරවැසියන්ට ඉඩ සලසමින් අධිකරණ සමාලෝචනයට ප්‍රවේශය සහතික කරන ලෙස රජයෙන් ඉල්ලා සිටීම.
2. පාර්ලිමේන්තු නියෝජිතයන් දැනුවත් කිරීම: මර්දන නීති අවලංගු කිරීමට සහ සංශෝධනය කිරීමට සහාය වීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රජයේ නිලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. මේ පිළිබඳ සානුකම්පිත වන නීති සම්පාදකයන් සමඟ එකාබද්ධව කටයුතු කිරීම තීරණාත්මක වනු ඇත.
3. සන්ධාන ගොඩනැගීම: වෙනත් සිවිල් සමාජ සංවිධාන, මානව හිමිකම් ආරක්ෂකයන් සහ අන්තර්ජාතික හවුල්කරුවන් සමඟ උද්දේශන ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමට සහ එක්සත් පෙරමුණක් නිර්මාණය කිරීමට සන්ධාන ඇති කරගත යුතුය.
4. අධීක්ෂණය සහ ලේඛනගත කිරීම: ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය කිරීම් නිරීක්ෂණය කිරීම, ලේඛනගත කිරීම සහ වාර්තා කිරීම සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් ඇති කිරීම. මෙම දත්ත නීතිමය අභියෝග සහ උද්දේශන ක්‍රියාවලීන් ජයගැනීමට උපකාරී වනු ඇත.

Transparency International Sri Lanka
366, Nawala Road, Nawala,
Rajagiriya,
Sri Lanka.

Phone: +94 11 4 369 781
Fax: +94 11 2 865 777
Email: tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

twitter.com/tisrilanka
lk.linkedin.com/company/tisrilanka
facebook.com/tisrilanka
instagram.com/transparency_sri_lanka
youtube.com/user/tisrilankatube

ANSPARENCY